# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,260 - 2021 දෙසැම්බර් මස 24 වැනි සිකුරාදා - 2021.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2518 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජනවාරි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2515 - B 82299 — 5,403 (2021/12)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) නිලධාරින් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2018 (2021)

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සහකාර පාලක නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2022 අප්‍රේල් මාසයේ දී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250 ක විභාග ගාස්තුවක් ද, සම්පූර්ණ විභාගය සඳහා රු. 500 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

04. *අයදුම්පත් :*

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාග යේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය ය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කර ගතහැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2022.01.31 වැනි දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිට වන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමු කර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත

ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

07. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දින තම ප්‍රවේශ පත්‍රයේ නිශ්චිතව සඳහන් නිලධාරියකුගෙන් අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාගයට පෙනී සිටින පළමු දිනයේම ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවකුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතු ය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. අපේක්ෂකයකු විභාගයට පෙනීසිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාග යට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. *විභාග පරිපාටිය :*

1. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. *විභාගය පිළිබඳ විස්තර :*

| *විෂය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|
| 01. නීතිය | පැය 03 | 100 | 40% |
| 02. පරිපාලනය | පැය 03 | 100 | 40% |
| 03. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 03 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා :
විභාග කොමසාරිස් ජනරාල්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට අවම වශයෙන් දෙවරක්.

5. විභාගය සඳහා වන විෂයය නිර්දේශය ෘ

| විෂයය අංකය හා විෂයය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| 01. නීතිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | i. ඓතිහාසික සංවර්ධනයද ඇතුළුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා ව්‍යවස්ථාව<br>ii. විධායක ජනරජයේ ජනාධිපති, අගමැති, අමාත්‍ය මණ්ඩලය හා රාජ්‍ය සේවා<br>iii. යුක්තිය පසිඳලීම<br>iv. පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය<br>v. රාජ්‍ය ප්‍රතිපත්ති උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා මූලික යුතුකම්<br>vi. අභිනියෝජන ව්‍යවස්ථා<br>vii. රජයේ හා රාජ්‍ය අධිකාරීන්හි වගකීම<br>viii. මූලික අයිතිවාසිකම් |
| | ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය | i. යුක්තිය පසිඳලීම<br>ii. ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය<br>iii. අධිකරණ සංවිධාන<br>iv. ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය)<br>v. 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත |
| | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය | i. දණ්ඩ නීති සංග්‍රහය<br>ii. සාක්ෂි ආඥාපනත |
| 02. පරිපාලනය | | i. කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධාන කිරීම හා සංවිධාන ක්‍රම<br>ii. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති |
| 03. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | i. ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය<br>● රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන<br>● රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය<br>● අරමුදල් යන්නෙහි අර්ථය<br>● ඒකාබද්ධ අරමුදල් හා එහි ක්‍රියාකාරීත්වය<br>● විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම<br>● අවිනිශ්චිත අවස්ථා අරමුදල<br>● වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය<br>● රාජ්‍ය ආදායම්<br>● මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය<br>● භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය<br>● වොරන්ට් හා අග්‍රිම අධිකාරිය<br>● විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්යභාරය<br>● රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)<br>● පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)<br><br>ii. ගණන්දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් පත්කිරීම, එම නිලධාරීන්ගේ බලතල හා කාර්යභාරය/වගවීම් හා වගකීම් ස්වභාවය<br><br>iii. අභ්‍යන්තර විගණනය |

| විෂයය අංකය හා විෂයය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| | | iv. රාජ්‍ය වියදම් සැලසුම්කරණය හා කළමනාකරණය<br>● සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම<br>● රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනාගැනීම<br>● සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය<br>● වාර්ෂික ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම<br>● අනුමත ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම<br>● වීරමොං පටිපාටිය ක්‍රියාත්මක කිරීම<br>● රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය<br>● මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම<br>● පරිපූරක ඇස්තමේන්තු<br>vi. රජයේ දේපළවල පාඩු හා ඇත්හැරීම<br>vii. විවිධ ගිණුම් කටයුතු<br>viii. මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම<br>ix. රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය<br>x. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය<br>● රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය<br>● රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය |

*සටහන* :

* ඉහත විෂයයන්ට එක වරම හෝ වෙන වෙනම පෙනී සිටිය හැකි ය.

* නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

* අපේක්ෂකයෙකු නීතිය විෂය සමත්වීම සඳහා එහි සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් ලකුණු තිස් පහක් (35) හා මුළු ලකුණුවලින් සියයට හතළිහක (40%) සාමාන්‍යයක් ලබා ගත යුතු ය.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ආගමන හා විගමන පාලක ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

යූ. වී. සරත් රූපසිරි,
පාලක ජනරාල්.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරු පාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2018 (2021)**

**First Efficiency Bar Examination for Assistant Controller (Departmental) Officers in the Executive Service Category of the Department of Immigration and Emigration - 2018 (2021)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
..........................................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම : ........................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ....................................................... .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ....................................................... .
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය : ....................................................... .
(සිංහලෙන්/ දෙමළෙන්)

03. ස්ත්‍රී/ පුරුෂභාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකතන අංකය :

06. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන් ඃ

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

07. උපන් දිනය ඃ

වර්ෂය ඃ | | | | | මාසය ඃ | | | දිනය ඃ | | |

08. දැනට දරන තනතුර ඃ
8.1 තනතුර :————.
8.2 පත්වීම් ලිපියේ අංකය :————.

09. 9.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? :————.
9.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
9.3 ලදුපත් අංකය :————.
9.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න (අදාළ නම් පමණි)
ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් ....................................... ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත්, විභාග ගාස්තුවෙන් නිදහස් බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

(තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

11. අත්සන සහතික කිරීම

මගේ දෙපාර්තමේන්තුවේ විධායක සේවාගණයේ නිලධාරියකු /නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...... .................................................................................... මයා/ මිය/ මෙනවිය ....................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

12 -534

**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික යොවුන් සේනාංකය

**2022 අධ්‍යයන වර්ෂය පළමු අදියර ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ජාතික යොවුන් සේනාංකයේ දිවයින පුරා පිහිටි ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථාන තුළ 2022 වර්ෂයේ පළමු අදියර පාඨමාලාව (මෘදු කුසලතා) සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ. මෙම පාඨමාලාව නේවාසික නොවන පූර්ණ කාලීන නොමිලේ පවත්වන පාඨමාලාවකි.

*පාඨමාලා සඳහා අයදුම් කිරීම :*

ජාතික යොවුන් සේනාංක පුහුණු පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන පහත දක්වා ඇත. ඔබ කැමති මධ්‍යස්ථානය තෝරාගෙන අදළ දිස්ත්‍රික්කයේ ජාතික යොවුන් සේනාංක පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත දක්වා ඇති විද්‍යුත් ලිපිනයට යොමුකළ යුතුය. අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමේ දී ලිපි කවරයේ වම්පස ''**2022 අධ්‍යයන වර්ෂය පළමු අදියර**'' යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් කළ යුතු අතර විද්‍යුත් තැපැලට යොමු කිරීමේ දී විද්‍යුත් තැපෑලෙහි විෂය යන ස්ථානයට 2022 වර්ෂය පළමු අදියර ලෙස සඳහන් කළ යුතු ය. **2022 ජනවාරි මස 10 වැනි දින අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වේ.**

| | | |
|---|---|---|
| වැඩි විස්තර සඳහා | - | ඔබට ආසන්නතම පුහුණු මධ්‍යස්ථානය හෝ පහත දුරකථන අංකයන්ට අමතන්න |
| දුරකථන අංක | - | 011-2688885<br>071-0377377 |
| ෆැක්ස් අංකය | - | 011-2684784 |
| ඊ-මේල් ලිපිනය | - | application@youthcorps.lk |
| වෙබ් ලිපිනය | - | www.youthcorps.lk |
| ෆේස්බුක් පිටුව | - | National Youth Corps |
| ප්‍රධාන කාර්යාලය | - | අංක 420,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. |

සභාපති/අධ්‍යක්ෂ,
ජාතික යොවුන් සේනාංකය.

ජාතික යොවුන් සේනාංක පාඨමාලාවෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ :

1. මූලික පාඨමාලාව හැදෑරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය හැදෑරීමට අවස්ථාවක්.
2. ගායන, වාදන, නර්තන, නාට්‍ය හා රංගකලා කුසලතාවන් සඳහා අපෙන් අත්වැලක්.
3. ඔබ තෝරාගත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් සඳහා යොමු කෙරේ.
4. දක්ෂතා ඇති පුහුණුලාභීන් හට සුවිශේෂී පාඨමාලා සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනැමේ.

ජාතික යොවුන් සේනාංක පාඨමාලාවේ සංයුතිය :

1. ඉංග්‍රීසි භාෂාව හා කථනය
2. දමිළ භාෂාව හා කථනය
3. සෞන්දර්ය අධ්‍යාපනය
4. සරඹ පුහුණුව
5. අභියෝගාත්මක ක්‍රියා පුහුණුව
6. වෘත්තීය මාර්ගෝපදේශනය සහ පෞරුෂ සංවර්ධනය
7. පුද්ගල නායකත්ව පුහුණුව
8. තොරතුරු තාක්ෂණය

රේන්ජර් තොරතුරු එක්රැස් කිරීම

**ජාතික යොවුන් සේනාංකය**

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

දිස්ත්‍රික්කය/மாவட்டம்/District : ප්‍රා. ලේ. කොට්ඨාසය/பிரதேச செயலகம்/Divisional Secretariat :
දු. අ./தொ. பே. இல./Tel. :

1. මුලකුරු සමග නම/முதல் எழுத்துக்களுடன் பெயர்/Name with Initials :-

2. සම්පූර්ණ නම/முழுப்பெயர்/Full Name :-

3. ස්ත්‍රී-පුරුෂභාවය/பால்/Gender :-

| ස්ත්‍රී/பெண்/Female | | පුරුෂ/ஆண்/Male | |
|---|---|---|---|

4. ජා. හැ. අ./அடையாள அட்டை இலக்கம்/N.I.C. No. :

5. පුරවැසිභාවය/இனம்/Nationality :

6. ආගම/சமயம்/Religion :

7. උපන් දිනය/பிறந்த திகதி/Date of Birth :

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

8. වයස/வயது/Age :

9. විවාහක/අවිවාහක/விவாக நிலை/Marital Status :-

| | |
|---|---|
| අවිවාහක/மணமாகாதவர்/Single | |
| විවාහක/மணமானவர்/Married | |

10. රියැදුරු බලපත්‍ර අංකය/சாரதி அனுமதிப்பத்திர இல./Driving License No. :

11. පෞද්ගලික විස්තර/சுயவிபரத் தகவல் /Personal Details :-

a. විද්‍යුත් තැපැල් ලිපිනය/மின்னஞ்சல் முகவரி/E-mail Address :-...............................................

b. ජංගම දු.අ/கைத்தொலைபேசி/Tel (Mobile) :- දු.අ. (නිවස)/தொலைபேசி/Tel (Home) :-

c. ලිපිනය/முகவரி/Address :-

d. දිස්ත්‍රික්කය/மாவட்டம்/District :- ප්‍රා.ලේ. කොට්ඨාසය/பிரதேச செயலகம் /Divisional Secretariat :-

e. ඔබ විශේෂ අවශ්‍යතා ඇති අයෙක් නම් ඒ කුමන තත්ත්වයක් ද යන්න සඳහන් කරන්න. (උදා. ගොළු, අන්ධ…) / எவ்வகையான மாற்றுத் திறனாளியாக இருக்கிறீர்கள் ? (உம் : வாய் பேச இயலாதவர், பார்வையற்றவர் ……/ What kind of a differently abled person are you (Speech Impediment, blind, etc . . . ) ? …………………………

f. භාෂා හැකියාව/மொழித் திறன்கள்/Language Proficiency
භාෂා හැකියාවට අදාළ අංකය සඳහන් කරන්න/மொழித் தேர்ச்சிக்கு உரிய இலக்கத்தை இடவும்/Enter the suitable number for your Language Skills

මූලික /அடிப்படை/Basic - **1** හොඳයි/நன்று/Good-**2** දක්ෂ/மிக நன்று/Fluent - **3**

| භාෂාව/மொழி/Language | කතා කිරීම/பேச்சு/ Speaking | කියවීම/வாசிப்பு / Reading | ලිවීම/எழுத்து/ Writing | සවන්දීම/கேட்டல்/ Listening |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි/ஆங்கிலம்/English | | | | |
| සිංහල/சிங்களம்/Sinhala | | | | |
| දෙමළ/தமிழ்/Tamil | | | | |

[වැදගත් - ඔබට යම් භාෂාවක් පිළිබඳ කුසලතාවයක් නොමැති නම් ''මූලික'' ලෙස සඳහන් කරන්න.]
[குறிப்பு.- மொழித் தேர்ச்சி அறிவு இல்லையாயின் "அடிப்படை" என்பதை தெரிவுசெய்க.]
[Note-if you don't have knowledge of language you may select 'Basic']

12. උසස් අධ්‍යාපන සුදුසුකම්/உயர் கல்வித் தகைமைகள்/Higher Education Qualifications
(සහතිකපත්‍ර/ඩිප්ලෝමා/උපාධිධාරී/පශ්චාත් උපාධි)
[சான்றிதழ்/டிப்ளோமா/பட்டம்/பட்டப்பின் படிப்பு]
(Certificate/Diploma/Degree/Post Graduate)………………………………………

නිවසේ සිට පුහුණු මධ්‍යස්ථානයට ඇති දුර/வீட்டிலிருந்து பயிற்சி நிலையத்திற்கான தூரம்/Distance from home to Centre :-

පුහුණු කාලය තුළ නවාතැන් පහසුකම් අවශ්‍ය ද?
பயிற்சிக் காலத்தினுள் தங்குமிட வசதிகள் தேவைப்படுகின்றதா ?
Do you need accommodation facilities during the period of training ? :- ඔව් / ஆம் / Yes  නැත / இல்லை / No

දුරකථන අංකය/தொலைபேசி/Telephone No. නිවස/மனை/Home ජංගම/கைத்தொலைபேசி/Mobile

ඔබ සතුව බැංකු ගිණුමක් පවතී ද ?
வங்கிக் கணக்கொன்றை வைத்துள்ளீர்களா?
Do you have a bank account ? ඔව් / ஆம் / Yes  නැත / இல்லை / No

බැංකුව-ශාඛාව/வங்கி-கிளை/Bank-Branch

ගිණුම් අංකය/கணக்கு இல./Account No.

මව, පියා, භාරකරුගේ නම/பெற்றோர்/பாதுகாவலர் பெயர்/Name (Parents/Guardian)

දුරකථන අංකය/தொலைபேசி/Telephone No. නිවස/மனை/Home ජංගම/கைத்தொலைபேசி/Mobile

ඔහුගේ, ඇයගේ පදිංචි ලිපිනය/முகவரி/Address :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

අ.පො.ස. උ/පෙළ. ප්‍රතිඵල/க. பொ. த. உயர் தர பெறுபேறுகள்/G.C.E. A/L Results :

වර්ෂය/வருடம்/Year :

විෂය ධාරාව/பிரிவு/Stream :

මාධ්‍ය/ஊடகம்/Medium :

| විෂය/Subject | සාමාර්ථය/Grade |
|---|---|
| | |
| | |
| | |
| | |

අ.පො.ස. සා/පෙළ ප්‍රතිඵල/க. பொ. த. சாதாரண தர பெறுபேறுகள்/G.C.E. O/L Results :

වර්ෂය/ஆண்டு/Year :

| විෂය/Subject | සාමාර්ථය/Grade |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

මූලික කුසලතා/திறன்கள்/Basic Skills :

..........................................................................................................................

බාහිර කුසලතා/கல்விசாரா செயற்பாடுகள்/Extra-Curricular Activities :

..........................................................................................................................

අපේක්ෂිත රැකියා/விருப்பமான தொழில்கள்/Preferred Jobs :

.......................................................

.......................................................

.......................................................

අවම වැටුප්

எதிர்பார்க்கும் ஆகக்குறைந்த சம்பளம்

Minimum Salary Expectation :

රැකියා අංශය (අංශ තුනම වුවද තෝරා ගත හැක)/தொழில் பிரிவு (எவ்வகையையும் தெரிவுசெய்ய முடியும்/working section (can select any sector as per your wish) :-

| | |
|---|---|
| රාජ්‍ය/அரச துறை/Government | |
| පෞද්ගලික/தனியார் துறை/Private | |
| අර්ධ රාජ්‍ය/அரச சார்பு நிறுவனம்/Semi Government | |
| ස්වයං රැකියා/சுயதொழில்/Self Employment | |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.
மேற்கூறப்பட்டுள்ள தகவல்கள் யாவும் உண்மையானவை எனவும் சரியானவை எனவும் இத்தாளில் உறுதிப்படுத்துகிறேன்.
I do hereby acknowledge that the above particulars given by me are true and accurate to the best of my knowledge.

..................
දිනය திகதி/Date

..................
මව/පියා/භාරකරුගේ අත්සන.
பெற்றோர் கையொப்பம்.
Parent/Guardian Signature.

..................
අයදුම්කරුගේ අත්සන.
விண்ணப்பதாரர் கையொப்பம்.
Applicant's Signature.

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | 1 | කටුනායක | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ධර්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක | 011-2260020 |
| | 2 | යක්කල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැරැල්ල වත්ත, යක්කල, ගම්පහ | 033-2233534 |
| | 3 | දිවුලපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වල්පිට, දිවුලපිටිය | 033-2272875 |
| | 4 | බුලත්සිංහල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බුලත්සිංහල | 034-2282322 |
| | 5 | අත්තනගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වතුපිටිවල, අත්තනගල්ල | 033-2282232 |
| මධ්‍යම පළාත | 6 | ගම්පොළ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය නාවලපිටිය පාර, කුඩාමකේ, ගම්පොල | 081-2078177 |
| | 7 | නාඋල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අරංගල, නාවුල | 066-2246204 |
| | 8 | නුවරඑළිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මීපිලිමාන, අඹේවෙල, නුවරඑළිය | 052-3536332 |
| | 9 | සෙංකඩගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර | 081-2389134 |
| | 10 | යටිනුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මුරුතලාව පාර, දෙහිදෙනිය | 081- 2410026 |
| | 11 | වලපනේ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, හරස්බැද්ද, වලපනේ | 052-2050010 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|---|---|
| දකුණු පළාත | 12 | සූරියවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාසල් මාවත, සූරියවැව | 047-2288169 |
| | 13 | ගාල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැකුණුගොඩ, බෝපේ, ගාල්ල | 091-2233182 |
| | 14 | අකුරැස්ස | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාරඹේ, අකුරැස්ස | 041-3131216 |
| | 15 | වීරකැටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047-2257143 |
| | 16 | දික්වැල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඌරුගමුව, දික්වැල්ල | 041-2255055 |
| | 17 | නෙළුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය පියසේන ගමගේ ගොඩනැගිලි පරිශ්‍රය, ඇඹලේගෙදර, නෙළුව | 091-3098911 |
| | 18 | අක්මීමන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, චීනමිත්‍ර ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන | 091-3121736 |
| | 19 | ලුණුගම්වෙහෙර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලුණුගම්වෙහෙර | 047-2239292 |
| | 20 | වීරවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වීරවිල | 047-3128444 |
| ඌව පළාත | 21 | බණ්ඩාරවෙල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බිඳුණුවැව, බණ්ඩාරවෙල | 057-2222214 |
| | 22 | මහියංගනය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාපාකඩවැව, මහියංගණය | 055-2257118 |
| | 23 | තණමල්විල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 3 කණුව, බෝදාගම, සූරිය ආර, තණමල්විල | 047-3220529 |
| | 24 | මොණරාගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, මොණරාගල | 055-2055741 |
| | 25 | වැල්ලවාය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාලබෝව, වැල්ලවාය | 070-5923971 |
| | 26 | සියඹලාණ්ඩුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව | 071-3662328 |
| උතුරු පළාත | 27 | මුලතිව් | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වඩ්ඩුවාකල්, මුලතිව් | 021-2290428 |
| | 28 | මන්නාරම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, තලෛයි මන්නාරම පාර, මන්නාරම | 023-2251917 |
| | 29 | වව්නියාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඉරට්ටෙපෙරියකුලම, වව්නියාව | 024-2054558 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|---|---|
| වයඹ පළාත | 30 | කුලියාපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, දෙගම්මැද, කුලියාපිටිය | 037-2283680 |
| | 31 | වාරියපොල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, උසාවිය පාර, වාරියපොල | 037-2268375 |
| | 32 | මාවතගම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඩෙන්වොර් වත්ත, මාවතගම | 037-2298668 |
| | 33 | පඬුවස්නුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නුගවෙල හන්දිය, තුත්තිරිපිටිය, පඬුවස්නුවර | 037-2291803 |
| | 34 | දොඩම්ගස්ලන්ද | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අලකොලමඩ, දොඩන්ගස්ලන්ද | 037-2252655 |
| | 35 | නාත්තණ්ඩිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සාගරගම, නාත්තන්ඩිය | 032-2050815 |
| | 36 | වෙන්නප්පුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කමලසිරි මාවත, බෝලාන, වයික්කාල, වෙන්නප්පුව | 031-2277199 |
| | 37 | අලව්ව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විලගමුව, අලව්ව | 070-3965010 |
| නැගෙනහිර පළාත | 38 | කුච්චවේලි | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සලප්පාරු, කුච්චවේලි | 026-2228709 |
| | 39 | ගෝමරන්කඩවල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල | 026-4549428 |
| | 40 | අම්පාර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල, උහන පාර, අම්පාර | 063-2224810 |
| | 41 | සේරුවාවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සේරුවිල සිරිදූව - සේරුනුවර | 026-4549439 |
| | 42 | ත්‍රිකුණාමලය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, රවුම්පාර, ශර්ධාපුර, චීනවරාය, ත්‍රිකුණාමලය | 026-4549432 |
| | 43 | දෙහිඅත්තකණ්ඩිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලිහිණියාගම, දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය | 027-2056723 |
| | 44 | වාලච්චේන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 18 වන සැතපුම් කණුව, කල්කුඩා, වාලච්චේන | 065-3121 085 |
| සබරගමුව පළාත | 45 | කෑගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මාවත, ගංගොඩවත්ත, කෑගල්ල | 035-2223260 |
| | 46 | නිවිතිගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අම්බලන්දෙනිය, වටාපත පාර, නිවිතිගල | 045-2279970 |
| | 47 | ගලිගමුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ආසියාදෙනිය, ගලිගමුව | 035-2282993 |
| | 48 | ඇඹිලිපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගම්උදා භූමිය, යෝධගම, ඇඹිලිපිටිය | 047-2262399 |
| | 49 | බලංගොඩ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බටුගම්මන, බලංගොඩ | 045-3129898 |
| | 50 | දෙහිඕවිට | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කනංගම, දෙහිඕවිට | 036-2267671 |

| *පළාත* | *අනු. අංකය* | *මධ්‍යස්ථානය* | *ලිපිනය* | *දුරකතන අංකය* |
|---|---|---|---|---|
| උතුරු මැද පළාත | 51 | කැකිරාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහවැලි සංකීර්ණය, ඔළුකරඳ, කැකිරාව | 025-2263297 |
| | 52 | මැදිරිගිරිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාය 03, නව නගරය පාර, මැදිරිගිරිය | 027-2050477 |
| | 53 | ගලෙන්බිඳුණුවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මොගොඩවැව, යකල්ල | 025-2258355 |
| | 54 | කලාවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගල්නෑව, බුල්නෑව, කලාවැව | 025-2269946 |
| | 55 | අනුරාධපුරය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාලඩිකුලම්, අනුරාධපුරය | 025-3852809 |

12-552

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.